

# බෞද්ධ ළමයා

ඇසළ කලඹ
(ජූලි)
03
2568/2024

බම්බලපිටියේ සිරි වජිරාරාමයේ ප්‍රකාශනයකි.



'මා නිවත්ත අභික්කම' - නො නැවැත ඉදිරියට යවු

| 66 වන කාණ්ඩය | බු. ව. 2568 ඇසළ මස පුර පසළොස්වක ද<br>ව්‍ය. ව. 2024 ජූලි 20 වන ද | 03 කලබ |
|---|---|---|

# ලක් දිව් ළමා පෙළ වෙත

අත් පත් නිවන් හැරැදමා මෙත්නෙන්[1] සතන් වෙත්
වන් මේ බිරම්[2] සසර මං පැරුමන් පිරුම් වස්
තුන් ලෝ දිනූ අප ගොයුම් මුනිඳුන් වහන්සේ
දම්සක් දෙසූ ඇසළ පුන් පෝයත් උදා වී

සද්දම් ලෙසින් මුනිරදුන් දෙසු ඒ මනා සේ
පවිකම් කෙරෙන් වැළැකෙමින් තුන් සිත් පුරා පින්
කා[3] සිත් වදන් තුන් දොරින් හික්මී සියල් දා[4]
ලක්දිව් ළමා කැල උතුම් සිරිතින් සැදෙත් වා

1. මෛත්‍රියෙන් 2. බිහිසුණු 3. කය 4. හැම දවස්හි

- ශ්‍රීනාත් ගණේවත්ත සූරීහු



# උත්සාහවතා දියුණුව ලබයි

***අභිධජ මහා රට්ඨගුරු අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ලියන ලද්දකි***

බරණැස් නුවර මහනුවණැති චුල්ලසෙට්ඨී නම් ධනවතෙක් විය. හේ නකත් ශාස්ත්‍රය හොඳට දන්නා කෙනෙකි. දිනක් පාරේ වැටී සිටි මළ මීයකු දැක, ඒ වේලාවට ග්‍රහ තරු පිහිටි සැටි විමසා බලා, "මේ මීයා ලැබූ උත්සාහවතුට මහ පොහොසතකු විය හැකි" යි කී ය. එබස් ඇසූ එක් දුගියෙක් ඒ මීයා ගෙනගොස් පොහොසත් වන්නට ඉටා ගත්තේ ය. මළ මීයා නිසා මුදලක් උපයන උපායක් සිතනුයේ බළල් පැටියකු ඇතිකරන ගෙදරකින් මුදලක් ලැබිය හැකියි දිටී ය. හේ එබඳු තැනක් සෝදිසි කර බැලී ය. බළල් පැටියකු ඇති කරන කඩයක් දැක, එහි ගොසින් මළ මීයා දී සුළු මුදලක් ලබා ගත්තේ ය. හේ මුදලින් උක් හකුරු ටිකක් කඩයකින් ලබා ගත්තේ ය. ඉන් පසු ඒ උක් හකුරුත් කළයෙක වතුරත් ගෙනගොස් මඟ නැවතී හිඳ, මල් වත්තෙන් මල් කඩාගෙන නුවරට එන අයට ඒවායින් ටික ටික දුන්නේ ය. එදා ඔහු කළ සැලකිල්ලට උපකාර වශයෙන් ගස්වලින් මල් බාගයක්

කඩා ගෙන, ඉතිරිහරිය ඒ දුගියාට කඩා ගන්නට බාර දී ගියහ. ඒ ගස්වල ඉතිරි මල් සියල්ල ඔහු කඩාගෙන ගොස් විකුණා මුදල් ටිකක් උපයා ගත්තේ ය. කිහිප දිනක් ම මෙසේ මල්වත්තේ මල් කඩන අයට උක්සකුරු හා පැන් හා දී, ගස්වලින් බාගයක් ලබාගෙන, එහි මල් කඩා විකුණා මුදල් ටිකක් ඉපයී ය. වැඩි දවසක් යන්නට පළමු මහා වැසි සුළඟෙක් ඇතිවිය. එයින් රජ්ජුරුවන්ගේ උයනේ ගස්වල කොළ හා අතු හා මහ රැසක් කඩා වැටිණ. ඒවා ඉවත් කිරීම උයන් ගොව්වාට බර වැඩෙක් විය. යටැකී දුගී මිනිසා එහි ගොසින් ඒ සියලු කොළඅතු උයනින් අහකට ඇද දමන්නට හැකිබව කී ය. උයන්ගොව්වා එයට කැමැති විය. එවිට ළමුන් සෙල්ලම් කරන තැනකට හේ ගියේ ය. ගොසින් උක්හකුරු කැබැල්ල බැගින් ඔවුන්ට දුන්නේ ය. දී, යහළුකැර ගෙන, උන් එක්ක අවුත් උන් ලවා ඒ සියලු අතු හා කොළ හා උයන් දොරකඩ කිට්ටුවට ඇදවී ය. ඉන්පසු දර සොයා යන කුඹලකුට ඒ දඬු කැබලි රැස විකුණා මුදල් ටිකක් ලබා ගත්තේ ය. ඉන් පස්සේ නුවර දොරකඩ ළඟ ලොකු පැන් සැළියක් තබා ගෙන තණකොළ කපාගෙන නුවරට විකිණීමට ගෙනයන අයට උක්සකුරු සමග පැනින් සංග්‍රහ කෙළේ ය. ඔහු "යහළු, අපෙන් ඔබට වුවමනා කිමෙක්?" කියා ඇසූහ. වුවමනාවක් වුවොත් පසුව බැරියැ යි කියා හේ කී ය.

මෙසේ ටික ටික මුදල් උපයන ඔහුට ඉන් පසුදා අස් වෙළෙන්දකු සිය ගණනක් අසුන් එහි ගෙන එන බව දන ගන්නට ලැබිණ. හේ එදින කල් ඇතිව ම ගොසින් තණකොළ කපන්නවුන්ගෙන් තණකොළ මිටි එක්

බැගින් ඉල්ලාගත්තේ ය. තමා තණකොළ විකුණන්නට පළමුවෙන් තණකොළ නොවිකුණන හැටියට ඔවුන්ගෙන් පොරොන්දු ගත්තේ ය.

එදා ආ අස්වෙළෙන්දාට තමාගේ අශ්වයනට දෙන්නට තණකොළ උවමනා විය. නුවර හැමතැන ම ඇවිදලාත් ඔහුට තණකොළ මිළට ගන්නට තැනක් නොලැබුණේ ය. ඉන් පස්සේ යට කී දුගියාගේ ගෙදරට ගොස් ලොකු මුදලක් දී ඔහු ළඟ තුබුණු තණකොළ මිටි සියල්ල ම ගත්තේ ය.

එයින් පසු දවසෙක වෙළෙඳුන් වගයක් ආ වියෙක තමාගේ පේරුස් මුද්ද අත්තිකාරමට තබා තමා කැමැත්ත නැති ව කාට වත් වෙළෙඳ බඩු නො විකුණන හැටියට වෙළෙඳුන් කැමැති කරවා ගත්තේ ය. නැවෙන් බඩු මිළයට ගන්නට ආ නුවර වෙළෙන්දෝ ඒවා ගන්නට හැටියක් නැති ව ඒ මිනිසාට දහස බැගින් දී බඩු අරවාගෙන තමන් සන්තක කැර ගත්හ. මේ අන්දමින් ටික දිනෙකින් රන්කාසි ලක්ෂ දෙකක් තරම් මුදල් උපදවා ගත්තේ ය.

දවසෙක හේ ගුරුපඬුරු හැටියට ලොකු මුදල් පසුම්බියකුත් රැගෙන තමාට පෝසත්වීමට මග පෙන්නූ චුල්ලසිටාණන් වෙත ගියේ ය. ගොස් කාරණය කී ය, චුල්ලසිටාණන් ඔහුගේ දක්ෂකම ගැන තුටු වැ තමාගේ දියණියන් සරණපාවා දී ඔහු තමාගේ මහබූදලයට හිමි කෙළේ ය.

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කෝමාර භච්චජීවක නම් වෙදදුරු පිදූ අඹ උයනෙහි වසන සේක් චුල්ලපන්ථක තෙරුන් ගැන මේ ජාතකය වදාළ සේක.

චුල්ලපන්ථක සාමණේර නම සාර මසක් වෑයම් කොටත් එක ගාථාවක් පාඩම් කැරැගත නොහැකි විය. උන් වහන්සේගේ වැඩිමාලු සොහොයුරු මහාපන්ථක තෙරණුවෝ තම බාල සොහොයුරාගේ මේ නුවණ මඳ බව සලකා, මොහු මේ මහණකමින් වැඩක් සිදුකැරගත හැකි නොවති යි සිතා ආරාමයෙන් පිටත් කළහ.

මේ දුටු භාග්‍යවතුන් වහන්සේ ඒ අසරණ සාමණේර නමට පිහිට වූ සේක. ඔහුගේ සිතේ සැටි බලා ඔහුට ගැළපෙන සේ වූ භාවනා ක්‍රමයක් දුන්සේක. එය වඩා චුල්ලපන්ථක හිමියෝ සිවු පිළිසැඹියා සහිතව රහත් වූහ.

මේ කාරණය ගැන දම්සබායෙහි භික්ෂූහු කතා කරමින් උන්හ. භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ එපවත් අසා " මහණෙනි, අද පමණක් නොව පෙරත් මෙතෙම මා නිසා තත්ත්වයෙන් උසස්බවට පැමිණියේ වේ ද" යි වදාරා එය වදාරන මෙන් ආයාචනා කර සිටිකල මේ (චූලසෙට්ඨි) ජාතක කථාව පැවසූ සේක.

(මෙහි ඒ එදා දුප්පත්ව සිට පසුව පෝසත් වූ පුරුෂයා මෙදා චුල්ලපන්ථක භික්ෂුව ය. ඔහුට පොහොසත් වන්නට මඟ පෑදූ චුල්ල සිටාණෝ නම් මෙකල බුදු වූ මම මැ යැ යි මේ ජාතකය පූර්වාපර සන්ධි ගළපා වදාළ සේක.)

වෑයමත්, නුවණත්, ඉවසිල්ලත් තිබේ නම් කාට වුවත් මෙහි කී දුගියා මෙන් දියුණුවන්නට බැරි නැත.



# වස්සාන කාලය

*කොළඹ 07, නාරද බෞද්ධ ධර්මායතනාධිපති,*
***රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති***
***හිමිපාණන් විසිනි***

සසුන් කෙත පල දරන නිවන් මඟපල ලබන
සිව්වණක් පිරිස තම සිත දියුණු කර ගන්න කාලයයි
මේ උදා වී ඇත්තෙ දුලබ මිනිසත් බවින්
පල නෙළා ගන්න නිසි කාලයයි

තුන් මසක් යන තුරුම මහ වැස්ස ඇද වැටෙන
කුරා කුහුඹුන් පවා නිදහසේ කල් ගෙවන කාලයයි
පිබිදෙන්න වැර දරන තණ පතකට පවා
නොරිදවා සිටිය යුතු කාලයයි

දන් සිල් ද භාවනා බණ ඇසුම් හා කියුම්
කරන්නට බෝ දෙනා සිත් බඳින කාලයයි
සිල් පුරා ගුණ දරා නිවන් දකිනා තුරා
කුසල් වඩවා ගන්න උදා වූ අමිල වූ කාලයයි

සුපිළිපන් මහ සඟන වෙහෙර තුළ වැඩ හිඳින
සිල් සමාදී ගුණෙන් වැඩෙන්නට වැර දරන කාලයයි
මේ උදා වී ඇත්තෙ සැදැහැ දන පින් පුරන
වසරකට වරක් එන වස්සාන කාලයයි



# ඇසළ මැදි පොහෝ දා පළමු දම් දෙසුම

(පූජාවලිය ධර්ම ග්‍රන්ථයේ පිටු අංක 209-220 දක්වා වූ ඉසිපතනාරාම පූජා කථාවෙන් උපුටා සංක්ෂිප්ත කරන ලද සටහනකි.)


***විශ්‍රාමික පාඨශාලාචාර්යාණී***
***ශාස්ත්‍රපති එච්. එම්. සුජාතා නාලනී නැන්දා විසිනි***


මින් වසර 2648 කට පෙර වෙසක් පෝ දාක ඉපිද, වසර දෙදහස් හයසිය දහතුනකට පෙර උදා වූ වෙසක් පෝ දාක බුද්ධ රාජ්‍යයට පැමිණ වදාළ අපගේ ශාන්ති නායක බුදු පියාණන් වහන්සේ ඇසළ මැදි පොහෝ දා පතළ සඳපානේ බරණැස ඉසිපතනාරාමයේ දී පළමු සදහම් දෙසුම "දම්සක් පැවැතුම් සුතුර" දේශනා කොට වදාළහ.

"එකල අනන්තාපර්යන්ත වූ බුදුන් දම්සක් පතුරුවා වස් වසන ඇසළ මස මැදි පොහෝ දිනය සම්ප්‍රාප්ත ව ඒ චන්ද්‍රයා ද සම්පූර්ණ විය. එදා බෝමැඩ සිට දෙසැත්තෑ ගවුවක් දුරුමඟ ගෙවා ඉසිපතන විහාරයට ඒකචාරී හස්තිපොවුවකු සේ, ඒකචාරී සිංහපොව්වකු සේ, ඒ මඟ වඩනා සේක.

එ කල උපක නම් ආජීවකයෙක් සන්හුන් ගමනින් එකලා ව වඩනා මාගේ ස්වාමිදරුවන් දැක, සඳරස් දුටු කුමුදුවිලක් සේ ඉතා ප්‍රසන්න වූයේ බුදුන් මුහුණ බලා සියලඟින් දිවන සවනක් රස් හා දෙතිස් පුරිස් ලකුණු හා ශ්‍රී මුඛයෙන් දිවන සඳ කැලුම් වන් බුදුරස් කඳ හා සඳමඬුල්ලක් ලූවා සේ සිසාරා සිටිනා බ්‍යාම ප්‍රභාමඬුලු පුන්සඳක් සේ දිලියෙන ශ්‍රී මුඛය දැකඃ ''ස්වාමීනි, තෙපි නිශ්චල වූ ගුණ මිහිකතගෙන් ගතු ද, ස්ථිර වූ ගුණ සනරන්මෙරින් ගතු ද, ගැඹුරු වූ ගුණ මහමුහුදින් ගතු ද, තෙජෝ ගුණ හිරු මඬලින් ගතු ද, සොම් ගුණ සඳ මඬලින් ගතු ද, අමා පිඬක් වැනි කෙනෙකු ව, මහපින් පිඬක් වැනි කෙනෙකු ව, ශක්‍රයා නම් තෙපි ද, බ්‍රහ්මයා නම් තෙපි ද, තොප දුටුවේලෙහි පටන් මාගේ සිත අමාපිරූ බඳුනක් සේ සන්තෝෂයෙන් ඉතිර ඉතා ප්‍රසන්න ය, හිමි, තෙපි කවුරු දැ, යි විචාළේ ය.

එ කල ස්වාමිදරුවෝ තමන් කෙරෙහි එදා ඔහු කළ සන්තෝෂයෙන් මතු බොහෝ වැඩ වන සේ දැක තමන් වහන්සේ ද මඳ මඳ සිනා පහළ කොට ඔහු මුහුණ බලාඃ ''ආජීවකය, මම ශක්‍රයාත් නො වෙමි, බ්‍රහ්මයාත් නො වෙමි, සම්මා සම්බුද්ධයෙමි, සියලු සංස්කාර ධර්මයන් සකසා නිමවා දතිමි, දුරුකළමනා ධර්මයන් යට අජටාකාශය උඩ අජටාකාශය සේ දුරින් දුරුකෙළෙමි, භාවිත කළමනා ධර්මයන් හැම අළලා අමාපිඬක් සේ හැර ගතිමි, පස්මරුන් ජය ගෙන සිටි හෙයින් මට අනන්ත ජිනයෝ ය යි යෙති" යි වදාළ හ.

එවේලෙහි ආජීවක තෙම බුදුන් කෙරෙහි අතිප්‍රසන්න වː ''යහළු අනන්තජිනයෙනි, එසේ වී නම් අද පටන් තෙපි මාගේ යහළුහ. මතු තොප කරා මා ආ දවසෙක තොප මෙසේ පොහොසත් බැවින් මා රක්‍ෂා කරවු දැ'' යි විචාළේ ය. ස්වාමි දරුවෝ තමන්වහන්සේ නිසා මතු ඕහට වන වැඩක් දැක මඳ සිනා පහළ කොට 'යහපත දරුව, පලා එව, එදවස් තොප රක්‍ෂා කරම්හ' යි වදාරා ඉසිපතනාරාමයට වැඩි සේක.

එකල පස්වග මහණහු දුරින් වඩනා බුදුන් දැක, 'භගවත් ගෞතමයෝ දුෂ්කර ක්‍රියා හැර පියා, බුදුවිය නොහී, දැන් අපකරා ම එමින් සිටිති. පෙරසේ අපි ඔහු නොවඳුම්හ'යි කතිකා කළහ.

එකල මාගේ ස්වාමිදරුවෝ ඒ භික්‍ෂූන්ගේ අදහස් දැන අනන්තාපර්යන්ත වූ සත්ත්ව ලෝකයෙහි පැතිර සිටිනා මහා මෛත්‍රී නමැති ජල ප්‍රවාහය ඒ පස්දෙනා කරා ම මෙහෙයා ලූ සේක. එවේලෙහි සැඩ වතුරෙහි මළ පරඬලාපත්, තුඹු පළෙහි නො හී ඉපිල පැන නැංගා සේ බුදුන් මෛත්‍රී කරත් කරත්, තමන් කරා වඩුත් වඩුත්, පස් දෙන ම හුනස්නෙහි හිඳගත නො හී සෙල්වී පැන නැංගාහ. ස්වාමිදරුවන් ළඟට වඩුත් වඩුත් බුද්ධ තේජසින් සිට ගත නොහී, පෙර මඟට ගොස්, තවද සිට ගත නොහී, බුදුන් වැඳ පෙරළී පා සිවුරු අතින් ගෙන, හිඳිනා අසුන් පනවා පැන් පවස් විචාරා, බුදුන් බුදු වූ බව් නොදැන, සාමීචි කතා කරන්නාහු "ආවුසො, වාදයෙන් සම සමයන් සේ කතා කෙරෙති. එ කල ස්වාමිදරුවෝ "මේ භික්‍ෂූහු මා බුදු වූ බව් නොදනිති. මම් ම මා බුදු වූ බව්

මොවුන්ට හඟවමි, යි සිතා "මහණෙනි, සම සමයන් හා කථා කරන්නා සේ ලොව්තුරා බුදුන් හා කථා නො කරව. මහණෙනි, මා සව්නේ ගෙවා බුදු ව තුන්ලෝ මුදුන්පත් වීමි. තොප හැම දෙනාගේ සැක හැර අද රෑ ධම්සක් දෙසුම් අසා බලගැ,යි වදාළ සේක.

එ බස් අසා පස්වග මහණහු බුද්ධ තේජසින් වෙවුලා කේශර සිංහයක්හු දුටු ඇත් පැටවුන් සේ දිව දළ නොසොල්වා එකත්පස්ව උන්හ. ඒ වේලෙහි ස්වාමි දරුවාණන් වහන්සේ අනන්තාපර්යන්ත වූ බුදුන් දම්සක් දෙසන දා වැඩ හිඳිනා වූ ධර්ම භූමියෙහි පැන නැඟි බුද්ධාසනයෙක් වීය... එකෙණෙහි මාගේ ස්වාමි දරුවන්ගේ ධර්මදේශනා කාලය සම්ප්‍රාප්ත විය. එකෙණෙහි දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයෝ 'අපගේ ස්වාමියා දහම් අමා වතුරෙහි අප හැම ගලා සංසාර දුක් නමැති මහ ගිම් නිවයි. ඔහුගේ දහම් අමාරස බොන්නට යම්හ'යි කියා දසදහසක් සක්වළ දිව්‍ය නාගයෝ කඩුපුල්මල් මිටි ගෙන දිවූ ය. ගරුඩයෝ මහපියුම් තුඩින් කඩාගෙන දිවූ ය. ගන්ධර්වයෝ තූර්යභාණ්ඩ ගෙන දිවූ ය. අසුරයෝ පළොල්මල් ගෙන දිවූ ය. දෙවියෝ පරසතු මල් ආදී වූ නන්විසිතුරු දිවමල් ගෙන දිවූ ය. බ්‍රහ්මයෝ සේසත් ගෙන දිවූ ය... මාගේ බුදුන්ගේ පළමුවන මඟුල් බණෙහි පිරිස් ගහනයෙන් මෙසේ අස්ලොමක් සා තැනුත් අවකාශයක් නැතිව සිටගත්තා වූ බණ පිරිස් ම ය...

එකල දෙවියන්ගේ පූජා කෝලාහලයෙන් බ්‍රහ්මාණ්ඩය දක්වා ගැවසී ගත් මුහුදු ගිගුමක් සේ ඒකනින්නාද විය. දෙවියන්ගේ අරගලය සන්හිඳුවා ලන්ට සමර්ථ අන්කිසි

සත්ත්වයෙක් නැති ම ය. බුදුන් වටා සිටි දස දහසක් ශක්‍රයෝ ඒ තමන් කළමනා ධුරයක් හෙයින් දසදහසක් දකුණුසක් පිඹ සක් පිට පතුරුවාගෙන විසි දහසක් අත් ඔසවා එකවිට අත්පොළසන් දී, 'ඔහෝ බණ පිරිස සන්හිඳෙව' යි කියා තුන් ලෝ වෙවුල්වා බැණ නැංගාහ. එවේලෙහි ඒ ශක්‍රඝෝෂාව අසා තුන්ලෝ පුරා සිටි දෙව් බඹ පිරිස් රළ නැති මුහුදක් සේ නිශ්ශබ්ද වූහ. එකෙණෙහි දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහ පොළොව සාධුකාර දින.

මාගේ ස්වාමිදරුවෝ ඒ මහීනාදය හා සමග තමන්වහන්සේගේ පාරමිතාදියෙන් පිරුණා වූ ශ්‍රීමත් මුඛපද්මය විවෘතකොට, බැණ නැගි බසින් දිවූ සුවඳ ගඳින් සියලු බණ පිරිස සුවඳ පිඬක් සේ කෙරෙමින් "ද්වේ'මේ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා, යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, යො චායං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො. එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී, උපසමාය, අභිඤ්ඤාය, සම්බෝධාය නිබ්බාණාය සංවත්තති"යි යනාදීන් ධම්සක් පැවතුම් සූත්‍ර දේශනාවට පටන්ගත් සේක.

... මහ පොළොව පටන් බඹලොව දක්වා ගැවසී සිටින මේ සා බණ පිරිසෙහි මේ මේ සත්ත්වයා රාග චරිත ය, ද්වේෂ චරිත ය, මෝහ චරිත ය, ශ්‍රද්ධා චරිත ය, බුද්ධි චරිත ය, විතර්ක චරිත ය යනාදීන් එකී එකී සත්ත්වයකුගේ

සිත් තෙසැටක්, තෙසැටක් නියායෙන් වෙන වෙන චරිත බලා බණ වදාරන සේක් ම ය.

තවද මාගේ ස්වාමිදරුවාණන් එක මාගධික ශබ්දයෙන් වදාරන්නා වූ බණ ඒ ඒ ප්‍රාණීහූ තමන් තමන් ගේ භාෂාවෙන් කියති යි සිතා විඳ විඳ අසති. මෙසේ සියලු සතුන්ගේ භාෂානුකූලව ම බණ වදාරන සේක් ම ය.

මෙසේ මාගේ ස්වාමි දරුවෝ සියලු සතුන් කැමැති කැමැති රස කවා පොවන එක් මෑණිකෙනකුන් සේ හැමදෙනා කැමැති කැමැති චරිතයෙන් බණ වදාරා ඒ දම්සක් පැවතුම් සූත්‍රදේශනාව මෙසේ සමහර කොට වදාළ සේක.

එකෙණෙහි පස්දෙනා වහන්සේට වැඩිමහලු අඤ්ඤාකොණ්ඩඤ්ඤ නම් මහ තෙරුන් වහන්සේ කෙළ දහසක් පමණ කෙලෙසුන් නසා දහසක් නයින් සම්පූර්ණ වූ සෝවාන් මාර්ගයෙන් වැද අමාමහ නිවන් පුරය දැක සතුටු වූහ.

මෙසේ එදා මාගේ ස්වාමිදරුවෝ (මින් වසර දෙදහස් හයසිය දහතුනකට පෙර) ඇසළ මැදි පොහෝදා පතළ සඳපානේ කළා වූ පළමුවන ධර්ම දේශනාවෙහි තුන් අසංඛ්‍යයක් දෙවියන් හා අටළොස් කෙළක් බ්‍රහ්මයන් නිවන් දක්වා වදාළ සේක."

**සැමට තෙරුවන් සරණ වේවා...!**



# ඇසළ පොහොය සමරමු බැතියෙන්

***ලක්මිණී සෙනෙවිරත්න නැන්දා විසිනි***

සුදෝ සුදු වතින් බොදු දරුවන් පිරිලා
බෝ හිමි සෙවණෙ දම් සිසිලස විහිදීලා
සාදු නදින් පන්සල් බිම ඔද වැඩිලා
නමදිමු ඇසළ පෝ දින හිමි සිහි කරලා

කල දිව දෙස කුලය මවු පස් බැලුම් බලා
සිදුහත් කුමරු මව් කුස තුළ පිළිසිඳුවා
සුදු ඇත් පොවුවකු ඇඳ පැදකුණු කරවා
මහමායා දේවි සුබ සිහිනය දුටුවා

රාහුල පුතු උපත සිදු වූ පොහොය දින යි
සිදුහත් කුමරු මහ අබිනික්මන් කෙරුව දින යි
දම්සක් සුතුර ඉසිපතන දි දෙසුව දින යි
මේ හැම කරුණු සිදු වූ අද පෝ දින යි

මවු දෙව් රදුන් හට සුමිහිරි දම් දෙසලා
මවු දෙව් තුමිය දුක් සසරින් එතෙර කළා
වස් තුන් මසක ආරම්භය වෙයි මෙ කලා
ඇසළ පුන් පෝය සමරමු අපි බැතිලා



# කියන්නා කෙසේ කීවත් ....

***කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිපීඨයේ***
***චේතිය ප්‍රභාෂණ අයියා විසිනි***

මුල නසා කඳට පැවැත්මක් නැත්තේ යම් සේ ද, පාදම කඩා ගොඩනැඟිල්ලකට රැක්මක් නැත්තේ යම් සේ ද, එලෙසින් ම ජාතියකට ඉතිහාසයෙන් තොර පැවැත්මක් නැත්තේ ය. එසේ හෙයින් ඉතිහාසය ඉගැනීමත් ඉතිහාසය ගැන වඩවඩාත් කියැවීමත් ඔබ විසින් කළ යුතු ය. මන්ද අප හමුවේ යම් නපුරක සේයාවක් ඇඳී ඇත. කාගෙන් ද? අඥාන ජනයාගෙනි. මෑත භාගයේ දී අපේ සිංහලකමටත් අපේ රටටත් මහ විපතක් ඇති විය. කෙනෙක් බෝසතාණන් වහන්සේ උපන්නේ අපේ රටේ යැයි කියති. කෙනෙක් බුදු රජාණන් වහන්සේ බුදුබව ලද්දේ අපේ රටේ යැයි කියති. මිහිඳු මහරහතන් වහන්සේ නිසා අපට කිසිවක් නොලැබුණ බවත් ඒ උතුමන් වහන්සේට පෙර සිට ම සිරිලක සසුන පැවති බවත් ඉංග්ලීසි ජාතිකයන් අපේ ඉතිහාසය විකෘති කරනා අදහසින් දඹදිව යනු ඉන්දියාවයි කියා කියූ බවත් කිය කියා නැති කරුණු සදමින් ඇති කරුණු විකෘති කරමින් කටයුතු කරති.

අඥාන ජනතාවෝ මේ මුසාවාද ව්‍යාපාරයට හසු වෙති. මුසාවාද ව්‍යාපාරයේ ඕනෑකම වන්නේ අපට අපේ ජාතික අනන්‍යතාව නැති කිරීමයි. අවියෙන් ආයුධයෙන් යටපත් කිරීමට නොහැකි වූ ජාතියට ජීවනාලිය වූ සසුනත් ඉතිහාසයත් නසා දැමීමෙන් අවසාන වශයෙන් ඔවුන් කල්පනා කරන්නේ  කුමක් ද? බුදුරජාණන් වහන්සේ ලක්දිව වැඩ විසූ බවත් උපන් බවත් කාලාන්තරයක් තිස්සේ ඔවුහු කියාගෙන ගොස් දඹදිව බුදුරජාණන් වහන්සේ නූපන් බවට සැක උපදවා බොදුනු සමාජය මුළා කරති. දෙවනුව, පළමු අදහස ඉටු වූ විට ඔවුන් කරන්නේ මෙරට ද බුදු කෙනෙකු නොසිටි බව කියා පෑමයි. ඉන් පසුව සිද්ධ වන්නේ කුමක් ද? බුදුරජාණන් වහන්සේ කියා කෙනෙකු කවරදාකවත් කොයි දීපයකවත් නූපන් බව කියා බුද්ධසාසනය අරාජික කිරීමයි. මේ මුසාවාද ව්‍යාපාරයට භික්ෂූන් වහන්සේලා ලෙස සැරසුණු පිරිසක් ද සම්බන්ධ වෙති. එසේ සම්බන්ධ වීමෙන් සිද්ධ කරන්නේ කුමක් ද? එසේ සම්බන්ධ වී ඔවුන් චීවරයේ ආධාරයෙන් බෞද්ධ සමාජයේ විශ්වාසය ඔවුන් වෙත කැඳවා ගනිති. බුද්ධ දේශනාවේ අර්ථය වරදවා අමුතු සහ අලුත් බණක් කියමින් තමන් මාර්ගඵලලාභී යැයි කියා බෞද්ධ ජනතාවගේ විශ්වාසයට සූක්ෂ්ම ලෙස පහර ගසති. මේ මුසාවාදකාරයෝ බුදුරජාණන් වහන්සේගේ බුද්ධභාෂිතයෙහි එන විවිධ වචනවලට තමන් කැමති කැමති අදහස් දෙති. වචන බෙදමින් වචන එකතු කරමින් බස ගැනවත් දැනුමක් නැතිව ආකුල ව්‍යාකුල අදහස් ම කියති. දෙසූ දේ නොදෙසූ දේ ලෙසත්, නොදෙසූ දේ

ම දෙසූ දේ ලෙසත් පෙන්වා විද්‍යාව, තාක්ෂණය ආදී පරිබාහිර කරුණු සමග සසඳමින් අලුත්ම බණක් කියන මොවුහු නාමික බෞද්ධ සමාජය මුළාකරති. කියවීමක් නැති, හැදෑරීමක් නැති, විවේක බුද්ධියක් නැති, ඇසෙනා ඕනෑම දෙයක් දොහොත් මුදුනේ තබා පිළිගන්නා මෝඩ පුරුෂයෝ මේවා අසා රැවටෙත්.

බුදුන් වහන්සේ ආශ්චර්ය මනුෂ්‍යයකු නොව සාමාන්‍ය කෙනකු බව ඔවුහු නිරන්තරයෙන් කියති. දෙතිස්මහාපුරුෂ ලක්ෂණ, අසීත්‍යනුව්‍යංජන ලක්ෂණ, මහා ප්‍රාතිහාර්යයන්, බුද්ධ ඥාන ඔවුහු සාහිත්‍ය කතාන්දර යැයි කියා භාග්‍යවතුන් වහන්සේ යනු අප වැනි ම සාමාන්‍ය කෙනෙකු බවත්, මනස දියුණු කිරීමෙන් ලබාගත හැකි ආශ්චර්යවන්තභාවයක් නොමැති බවත් කියති. ඉන්පසුව කරන්නේ කුමක් ද? ඔවුන් ඊළඟට සිද්ධ කරන්නේ බුදුරජාණන් වහන්සේලා ගණනාවක් පහුගිය කාලයේ දී පහළ වී ඇති බවත් වර්තමානයේ පවා බුදුවරු වැඩවසන බවත් ප්‍රකාශ කිරීමයි. 'දුල්ලභෝ බුද්ධුප්පාදෝ ලෝකස්මිං' ලෝකයේ බුදුවරුන්ගේ පහළ වීම දුලබ ය.

මේ සියල්ල අවසානයේ වන්නේ කුමක්ද දරුවනි? වන්නේ අනෙකක් නොව බෞද්ධ සමාජය දෙකට තුනට බෙදා වෙන් කිරීමෙන් බුදුරජාණන් වහන්සේ කියා කෙනකු ඓතිහාසිකව වැඩ නොවිසූ බවට කරුණු දැක්වීම සඳහා මග පාදා ගැනීමයි. නිවන යනුවෙන් යමක් නැති බවත්, කර්මය කර්මඵලය යනුවෙන් යමක් නැති බව කීමත්, දිව්‍යලෝක අපාය යනුවෙන් කිසිවක්

නැති බව කීමත්, අපාය දිව්‍ය ලෝකය යනු අප අතරම පවතිනා මේ පසිඳුරන්ට පෙනෙන ලෝකයම බව කීමත්, දානයේ ආනිසංස නැති බව කීමත්, බුද්ධ වන්දනාව අර්ථශුන්‍ය බව කීමත්, වෙහෙර විහාර ඉදිකිරීම හිස් වැඩක් කියා කීමත්, භික්ෂූන් වහන්සේලා සහ ගිහියන් අතර කිසි වෙනසක් නැති හෙයින් ගරු නොකළයුතු බව කීමත් මේ අය මේ මුසාවාදවලට සමාන්තරව කියවති. බෞද්ධ පවුල් විහාරයෙන් දහම් පාසලෙන් ඈත් වෙයි. අවසානයේ බෞද්ධ මහාසමාජය මිථ්‍යා දෘෂ්ටියේ වැටෙයි. කර්මය කර්මඵලය ගැන නොඅදහන තිරිසනුන් හා සමව හැසිරෙයි.

"නාහං භික්ඛවේ, අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි යං ඒවං මහාසාවජ්ජං: යථයිදං භික්ඛවේ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨිපරමා භික්ඛවෙ වජ්ජානීති."

'මහණෙනි, මේ මිථ්‍යා දෘෂ්ටිය සේ මහාසාවද්‍ය වූ අන් එකදු ධර්මයක් (මාගේ සර්වඥතා ඥානයෙන්) නො දකිමි. මහණෙනි, මිථ්‍යා දෘෂ්ටිය වරදවල් අතරින් සියල්ලට ම මහත් වරද වේ.'

වර්තමාන සමාජය දැනුම සොයායන්නේත්, දැනුම යැ යි විශ්වාස කරන්නේත් සමාජ මාධ්‍යයෙන් එන තොරතුරු කියා දන්නා මේ අය ඊළඟට කරන්නේ විවිධ සමාජ මාධ්‍ය ඔස්සේ ඇසූ පමණින් විශ්වාස කටයුතු ලෙස මුසාවාද සකසා ඉතා තාක්ෂණික නිර්මාණාත්මක සහ ආකර්ෂණීය ලෙස, කතාන්දර ලෙස මේ මිසදිටු මත සමාජගත කිරීමයි. දරුවනි, වසුරු රත්‍රන් වලින් සැරසුව ද වසුරු ම වන්නා

ලෙස ම කොතරම් නිර්මාණාත්මක ව තාක්ෂණික ව සහ ආකර්ෂණීය ව මේ මුසාවාදකාරයන් තමන්ගේ බොරු පැතිරුවත් වසුරු හා සමාන බව දැනගත යුතුයි.

**ධම්මං විනා නත්ථි පිතා ච මාතා**
**තමෙව තාණං සරණං පතිට්ඨා**
**තස්මා හි භො කිච්චමඤ්ඤප්පහාය**
**සුණාථ ධාරෙථ චරාථ ධම්මෙ**

යනු හෙයින් ධර්මය හැර මවක පියෙකු සරණක් නැති බව දැන ධර්මය ඇසීමෙන් ධාරණය කිරීමෙන් සහ ධර්මයෙහි හැසිරීමෙන් මිස මේ මුසාවාදකාරයන් හෙවත් විකෘති මතධාරීන් පරදවන්නට වෙනත් මඟක් නැත. අප ධර්මයේ හැසිරෙන තරමට ම අපට තුනුරුවන කෙරෙහි ශ්‍රද්ධාව උපදී. බුද්ධ ධම්ම සංඝ යන රත්නත්‍රය කෙරෙහි යම් හිස් ප්‍රකාශයක්, මුසාවාදයක් ඇසූ පමණින් කෝප වන්නේ නොමැතිව ඉතා සිහිනුවණින් පළමුව කළ යුත්තේ කුමක් ද? පළමුව එසේ කියූ තැනැත්තාට මෛත්‍රී කරන්න. මන්ද තුනුරුවන කෙරෙහි සදොස් මතවාද පළකරන්නා මෙලොව ජීවත් වන්නේ නමුත් ඒකාන්තයෙන්ම සතර අපායේ වැටෙන්නෙකි. මිසදිටුවෝ විනිපාත නම් නරකයේ වැටෙත්. ඉතා සුළු කාලයකින් මහා විපතක් වන්නට නියමිත කෙනෙකු දැකීමෙන් එම විපත නවත්වන්නට නොහැකි තැන අපි අනුකම්පා කොට මෛත්‍රිය පෑම හැර කුමක් කරමු ද! එසේ හෙයින් පළමුව අධර්මවාදියාට මෙත් වඩන්න. ඔහු ඉතා වැරදි අදහසකට ප්‍රවේශ වී ඇත්තේ පාපමිත්‍ර ආශ්‍රයක ප්‍රතිඵලයක් නිසා,

එවන් පාප මිත්‍රයෝ ඔවුනට ද තමාට ද කිසිදු භවයක සම්මුඛ නොවෙත් වා යි ප්‍රාර්ථනා කරන්න. ඔවුන් මේ භවයෙන් මිදෙන්නට පෙර යම් සත්පුරුෂ ඇසුරක් ලැබී ධර්ම මාර්ගය උදා වේවා යි මෙත් වඩන්න. ඔවුන් වරදවා ප්‍රකාශ කරන කරුණු මොනවාද කියා හොඳින් අසා සිට ඒවාට මෛත්‍රියෙන් යුතුව බුද්ධ සාසනයේ යහපත පිණිස මූලාශ්‍රය ආධාරයෙන් පිළිතුරු බඳින්න. එසේ කරන්නට නම් ඔබ හොඳින් පොත පත කියවා ධාරණය කරගන්න. තර්ක කිරීමේ අදහසින් නොව සමාජය සුවපත් කිරීමේ අදහසින් ධර්මය හදාරන්න.

අද දවසේ මේ සා විශාල සාසන, ඉතිහාස විකෘතියක් වනවා නම් හෙට දවසේ එය තව තවත් විහිදී පැතිරී ගොස් වනස්පතියක් නසනා පිළිලයක් ලෙස අපේ ඉතිහාසයත් බුද්ධ සාසනයත් විනාශ කරනවා සිකුරුයි. ඒ උපද්‍රවයට යුද්ධයෙන් පිළිතුරු දිය නොහැකි ය. අවි ආයුධවලින්, සටනින් සහ කාය බලයෙන් රැකිය හැක්කක් නොවේ බුදු සමය. පිළිතුරු දිය හැකි එකම ක්‍රමය නම් බුදුපියාණන් වහන්සේ පෙන්වා වදාළ මඟ පිළිපැදීම සහ දැනුමෙන් පෝෂණය වී නිවැරදි මතයන් සමාජයට කියාදීම යි. ඒ නිසා, බෞද්ධ දරුවන් වන ඔබට පැවරී ඇති මේ මහඟු කාර්යය ගැන හොඳින් හිතේ දරාගෙන වැඩෙන්න. දැනුමෙන් අනූන බෞද්ධ දරුවන් ම මිස හෙට දවසේ සසුනට වන මහ විපතෙන් සසුන රැක ගැනීමට සමත් වන වෙනත් වීරයකු උපදින්නේ නැත.

**ජිනවචනනදී චිරං වහතු...!**



# ව්‍යාඝ්‍ර ජාතකය

*ජයසුමනා ද සිල්වා රොබට්සන් මහාත්මනිය විසිනි*

එක කාලෙක බරණැස් නුවර මහාසත්ත නම් රජකු රාජ්‍ය කරන කල්හි අප මහා බෝසතාණෝ මෙතුමාගේ බාල පුත්‍රයා ලෙස උපත ලබා නමින් මහාසත්ත වූහ. මේ මහාසත්ත කුමාරයාට වැඩිමහල් සොහොයුරන් දෙදෙනෙක් වූහ. මොවුහු නමින් ප්‍රශාද සහ මහාදේව වූහ. කුමරුන් තිදෙනා ම එකලෙස ගුණවත් වූහ. සුවච කීකරු වූහ.

(මාළිගය අබියස)

<u>මහාසත්ත රජතුමා</u> : මා හිතවත් පුරෝහිත, අද වටපිටාව දීප්තිමත් දිනයකි. මේ වනාහි වනෝද්‍යානයක් කරා විනෝද චාරිකාවක් යාමට ඉතා සුදුසු කාලගුණයකි.

<u>පුරෝහිත</u> : මහා රජතුමනි, ඔබවහන්සේගේ කැමැත්ත ඉටුවේවා!

<u>මහාසත්ත රජතුමා</u> : එසේනම් හිතවත් පුරෝහිත, වහාම ඇමතිවරුන් කැඳවා මේ ගැන දන්වා සිටින්න.

<u>පුරෝහිත</u> : එසේය මහා රජතුමනි, ඔබවහන්සේගේ අභිමතය පරිදි අවශ්‍ය කටයුතු සියලු ආරක්ෂාව සහිතව සූදානම් කරන්නෙමි.

මහාසත්ත රජතුමා මහේෂිකාව, කුමාරවරුන් තිදෙනා ද සමඟ සහපිරිවරින් වනෝද්‍යානය කරා ගමන් ඇරඹුවා. විනෝදයෙන් මහමඟ ගෙවා උද්‍යානයට සම්ප්‍රාප්ත වූ රජ පිරිස අවට ආකර්ෂණීය වන සිරි නරඹමින් ඉදිරියට ගමන් ගත්හ. පියරජුගෙන් අවසර ලබාගත් කුමාරවරු සේවක පිරිස සමඟ නිදැල්ලේ හැසිරෙමින් වනය අභ්‍යන්තරයට ගමන් ගත්හ.

ප්‍රශාද කුමරා ඃ සහෝදරවරුනි, මේ කඳු මුදුනේ සිට පහළ බලත්ම අපට දිස්වන පෙදෙසේ ශ්‍රී විභූතිය කෙතරම් මනස්කාන්ත ද !

මහාදේව කුමරා ඃ ඉදිරියෙන් ගලාබස්නා රිදී දිය දහරින් හෙබි දිය ඇල්ලේ නයනකාන්ත දර්ශනය නෙත් පිනවන්නකි.

මහාසත්ත කුමරා ඃ මෙවන් චමත්කාරජනක සොබාදහමේ අසිරිය කෙසේනම් වර්ණනා කරන්න ද? අර ඈතින් ඇසෙන කෝකිල ගී නාදයට සහෝදරයිනි සවන් යොමුකරන්න. කෙතරම් මිහිරි ස්වරයක්ද ?

ප්‍රශාද කුමරා ඃ සහෝදරයිනි, අප මෙතැන කාලය ගතකළා වැඩි නේද ? කාල සීමාව ඉක්මවා ගොස් ඇති බැවින් අපට අප ජීවත්වන ලෝකය අමතක වීගෙන යනවා වගෙයි. දයාබර දෙමාපියන් අපට කුමක් සිදුවී ඇද්දැයි කුතුහලයෙන් පසුවෙනවා ඇති. පවුලේ වැඩිමහල් පුතා ලෙස බාල අයගෙ ආරක්ෂාව ගැන මා වගකිවයුතු වන්නේය.

මහාදේව කුමරා ඃ එසේනම් අයියණ්ඩිය, දැන් අපි වහාම රාජ පිරිස සොයා යමු.

මහාසත්ත කුමරා ඃ පුරෝහිත බමුණා මුලින් අපව දැනුම්වත් කළ පරිදි පියාණන් රාජකාරි කටයුතු උදෙසා කලින්ම බරණැස බලා පිටත්ව යන්නට ඇති.

මහාදේව කුමරා : ඒ බව නම් විශ්වාසයි. එමනිසා අපට හදිසිවීමට උවමනාවක් නැහැනේ. ප්‍රශාද අයියේ අපි විවේකයෙන් මාළිගාව බලා ගමන් ආරම්භ කරමු.

ප්‍රශාද කුමරා : දයාබර සහෝදරයිනි, අයියෝ අයියෝ මට සිතෙන විධියට නම් අපට ඉදිරියෙන් අභාග්‍ය සම්පන්න සිද්ධියකට මුහුණ දීමට සිදුවනවා වගෙයි. අහෝ අර දුක්ඛිත දර්ශනය දෙස බලන්න. අනේ අර ප්‍රපාතයේ සිටින ව්‍යාඝ්‍ර ධේනුව රෞද්‍රව බලා සිටිනවා. ඇය සිය පැටවුන් ගිලදැමීමටයි සූදානම. මොවුන් කොතරම් අසරණද ! සාගින්නෙන් පෙළන බව පේනවා.

මහාදේව කුමරා : අයියණ්ඩිය අනේ ඔවුන්ගේ ආහාරය කුමක් ද?

මහාසත්ත කුමරා : ලේ මස් තමා සිංහයින්ගේ හා ව්‍යාඝ්‍රයින්ගේ ප්‍රධාන ආහාරය. මේ ව්‍යාඝ්‍ර ධේනුව බෙහෙවින් දුර්වල තත්ත්වයක පසුවෙනවා. ඇය දින කිහිපයක් නිරාහාරව පසුවන්නට ඇති. කුඩා පැටවුන් කිහිපදෙනා ඇය වටා බියෙන් සිටින හැටි බලන්න. ව්‍යාඝ මව වෙත පැන මරා කෑමට සූදානම් බවයි දිස්වෙන්නේ. මේ දුක්ඛිත අසරණ සත්වයන්ගේ ආහාරය ලබා දීම වෙනුවෙන් දිවි පිදීමට කෙනකු සූදානම් වනුයේ නම් එය කෙතරම් ශ්‍රේෂ්ඨ, එමෙන් ම මහානිශංස ලැබෙන ක්‍රියාවක් ද!

මහාදේව කුමරා : සැබවින්ම සහෝදරවරුනි එවැනි ජීවිත පරිත්‍යාගයක් කිරීමට තරම් කවරකුට චරිත ශක්තියක් හා ආත්ම ශක්තියක් ඇති වේද ?

ප්‍රශාද කුමරා : සිවුපා සතකු වෙනුවෙන් ජීවිත පූජාවක් කිරිමට තබා, එවන්නක් ගැන සිතීමට වත් නිර්භීත කෙනකු සිටිය හැකිද ? එහෙත් අපගේ බාල සොහොයුරු මහාසත්ව නම් එවැන්නක් සඳහා සිතා බැලීමට වත් ඉදිරිපත් විය හැකියි.

මේ සංවේගී දර්ශනය ගැන මහත් කළකිරීමට පත් මහාසත්ව කුමරා ඒ ගැන නිහඬ විය.

මහාසත්ව කුමරා : (තමාට ම කියා ගනිමින්:) ''මා ඒ අසරණ ව්‍යාඝ්‍ර ධේනුව කරා යා යුතුයි. නිරාහාරව සිටින ඇය වෙනුවෙන් මාගේ ශරීරය පරිත්‍යාග කළ යුතුයි. ජරා මරණයට භාජනය වන, දුගඳ හමන මේ ශරිරය සුවඳ විලවුන් ගල්වා සරසන්නේ නමුදු මොහොතකින් ආවේණික දුර්ගන්ධය වහනය වන්නේ වේ. මා තවත් කෙනකුගේ සැපය වෙනුවෙන් ක්‍රියාකිරීමට නොපසුබට විය යුතුයි. සියලු සතුන් කෙරෙහි කරුණා මෛත්‍රි දැක්විය යුතුයි. මේ අශුභ පිළිකුල් සිරුර බිලි දී, මා මේ ව්‍යාඝ්‍ර ධේනුව සහ ඇයගේ අසරණ පැටවුන් පස්දෙනාගේ දිවි ගලවන්නෙමි. මේ පුණ්‍යකර්මය මට බුද්ධත්වය ලබා ගැනීමට හේතු වාසනා උපකාරී වී, සියලු සතුන් සසර සයුරින් එතෙර කරවීමට අවස්ථාව ලැබේවා !

මහා කරුණාවෙන් ඉපිළී පරාර්ථ සේවය වෙනුවෙන් ධෛර්යවත් වූ සිතින් යුතු වූ මහාසත්ව බෝසත් කුමරා, කඳු මුදුනින් ප්‍රපාතයට පැන ව්‍යාඝ්‍ර ධේනුවගේ අයාගත් මුඛයට ගොදුරක් බවට පත්විය. මේ මහා ජීවිත පරිත්‍යාග අවස්ථාවේදී මිහිකත කම්පා වන්නට විය.


ප්‍රශාද කුමරා : ඛේදයකි ! බියදැනවීමකි ! මේ භූමි චලනය කුමක් නිසාද ? සැබවින්ම උත්තම පුරුෂයකුගේ ක්‍රියා කලාපයක් සම්බන්ධව වන්නට පුළුවනි. ව්‍යාඝ්‍ර ධේනුව දුටු කල්හි ඔහු කථා කළේ මහා සංවේගයකින්.

මහාදේව කුමරා : අයියණ්ඩිය, මහාසත්ව අප හා එකතුවීමට හැකි ඉක්මනින් එනබවට පොරොන්දු උණා. එහෙත් ඔහු තවමත් පෙනෙන මානයකවත් නැහැ. එම නිසා අපි ඔහු සොයා ව්‍යාඝ්‍ර ධේනුව සිටිනු දුටු තැනට වහාම යමු.

ප්‍රශාද කුමරා : සැබැයි සැබැයි. අපි ඉක්මනින් පිටත් වෙමු. රාජ පිරිස මාළිගාව බලා ආපසු පිටත්වන්නට ඇති. අප දෙදෙනා පමණක් මේ ශෝකාන්තයට මුහුණදීමට හුදෙකලාව මෙහි සිටිනෙමු.

මහාදේව කුමරා : ආ මල්ලියේ, මේ එම ස්ථානය නේද! අහෝ අහෝ මේ කෙතරම් ඛේදජනක දර්ශනයක් ද ! අර පෙනෙන්නේ අපේ මහා කාරුණික සහෝදරයාගේ ඇඳ සිටි ඇඳුම් එල්ලා තිබෙන ගස නේද ? අයියෝ මහා දුකකි ! ඔහු ජීවතුන් අතර නැති බව ඔප්පු වේ. කුමක් බලාපොරොත්තු වන්ටද ! මේ මහා අභාග්‍යයකි ! මහාසත්ව අවසන් ගමන් ගොස් ඇත.

ප්‍රශාද කුමරා : මලණ්ඩ, අප වහාම මාළිගයට ගොස් මහාසත්වගේ මවිතකර හා ශෝචනීය අවසානය ගැන දෙමාපියන්ට දැනුම්දිය යුතුයි. කඳු මුදුනෙන් පහළට පැන ඔහු ව්‍යාඝ්‍ර ධේනුවට සිරුර පරිත්‍යාග කර ඇත. මහාසත්ව මේ ජීවිත පරිත්‍යාගයෙන්, ව්‍යාඝ්‍රයාට ගොදුරක් වීමෙන් ජීවිත පහකට අභය දානය දී ඇත. මේ මහත්ඵල මහානිශංස පුණ්‍ය බලයෙන් අපගේ උදාර සහෝදරයාට ඔහුගේ පරමාර්ථය මුදුන්පත් වී අතිඋතුම් බුද්ධත්වය සාක්ෂාත් වේවා...!






Abans

DSI SUPERSPORT
SRI LANKA'S NO.1 SCHOOL FOOTWEAR

sarasavi
THE BOOKSHOP

SINGER

සම්පත් බැංකුව
හෙට දින එළිය කරයි

0112 30 30 50 www.sampath.lk



ISSN 2279-2163

9 772279 216307 >

රු. 30.00